**සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල - 2022**

**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ *සහ* 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්

කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරන අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බුදුපුත් මාපිය උපහාර නිවාස ව්‍යාපෘතිය යටතේ ස්වාමීන් වහන්සේ 18 නමකට රු.100,000 බැගින් රු.1,800,000 ක මුදලක් පළමු අදියර වෙනුවෙන් 2021 වර්ෂයේදී ගෙවා තිබුණි. ඊට අදාළ දෙවෙනි වාරික මුදල වශයෙන් රු.100,000 බැගින් ගෙවිය යුතු වූ රු.1,800,000 ක මුදල ගෙවීම් කිරීම සඳහා වෙන්කිරීමක් 2021 වර්ෂයේ දී සිදු කර නොතිබූ අතර 2022 වර්ෂයේදී රු. 300,000 ක මුදලක් පමණක් ස්වාමීන් වහන්සේලා තුන්නමක් වෙනුවෙන් ගෙවා තිබුණි. තවද, ඉතිරි රු. 1,500,000 ක මුදල සඳහා 2022 වර්ෂයේදී ද වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | කුල දරුවන් පූජාකළ බුදුසසුනට දෙමාපියන් 18 දෙනෙකු සඳහා බුදුපුත් මාපිය නිවාස ආධාර පළමු වාරිකය ලෙස රු. 100,000 ක් බැගින් රු. 100,000 ක් ලබාදෙන අතර ප්‍රගතිය සොයා බලා දෙවන වාරිකය ලෙස රු. 500,000 ක් දෙමාපියන් 5 දෙනෙකු සඳහා ලබාදීමට කටයුතු කර ඇත. ප්‍රගතිය වාර්තා ලැබීමෙන් පසුව ඉතිරි දෙමාපියන් 13 දෙනා සඳහා දෙවන වාරිකය ගෙවීමට කටයුතු කරමි. | ගෙවිය යුතු වියදම් උපචිත වියදම් වශයෙන් ගිණුම්ගත කළයුතු බව. |
| (ආ) | අරමුදල විසින් 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල එදිනට පැවති කොඩි සහ ස්ටිකර් ප්‍රමාණය සම්බන්ධ තොරතුරු ඇතුළත්ව නොතිබුණු අතර වර්ෂයට අදාලව තොග සමීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත කොඩි ලබාදීම නිසා ඉතිරි කොඩි සම්බන්ධයෙන් නිවැරදි දත්ත ලබාගැනීමට අපහසු බැවින් ඉදිරියේදී නව පාලක මණ්ඩලය දැනුවත් කර තොග සමීක්ෂණයක් සිදු කිරීමට සටහන් කරගතිමි. | තොග සමීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතු බව සහ ඊට සුදුසු ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අලෙවි කිරීම සඳහා පැවති, රෙදිවලින් සකස් කරන ලද බෞද්ධ කොඩි සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2371 ක් බව ලේඛන අනුව නිරීක්ෂණය වුවද ඒ සම්බන්ධව භෞතික ගණනය කිරීමක් සිදු කර නොතිබුණි. තවද, එම කොඩිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී තොග ගණනයක් සිදුකර එම කොඩිවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට සටහන් කරගතිමි. | තොග සමීක්ෂණයක් සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතු බව සහ ඊට සුදුසු ආකාරයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු බව. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනතේ | | | |
| (i) | 6 වගන්තියේ (ඊ)උප වගන්තිය | අරමුදලේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ප්‍රමාණවත් නිලධාරීන් හා සේවකයින් පත්කිරීම හා සේවයේ යෙදවීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නව පාලක මණ්ඩලය නැවත වරක් දැනුවත් කිරීමට සටහන් කර ගතිමි | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (ii) | 07 වගන්තියේ විධිවිධාන පරිදි අනුමත කර ගෙන තිබූ සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල රීති මාලාවේ 8.1 වන ඡේදය | මහා සභා රැස්වීම මාස තුනකට වරක් සහ විධායක රැස්වීම මාසයකට වරක් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මහා සභා රැස්වීම් 02 ක් සහ විධායක රැස්වීම 04 ක් පමණක් පවත්වා තිබුණි. රැස්වීම් නොපැවැත්වීම හේතුවෙන් අදාළ පරිදි සැලසුම් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයක් පැවතුණි | රටේ පැවති අයහපත් තත්ත්වය හේතුවෙන් නියමිත පරිදි රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව දන්වා සිටිමි. | පනතේ විධිවිධාන පරිදි රැස්වීම් පැවැත්විය යුතු බව |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. .3,907,854 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,192,333 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,100,187 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන පොලී ආදායම වැඩිවීම, වෛද්‍යාධාර ලබා දීම අඩුවීම, සහ නිවාස ආධාර ලබා නොදීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දහම් පාසැල් කොඩි අලෙවි කිරීමට අදාළ මුදල් රැස් කිරීම හා බැංකුගත කිරීම පිළිබඳ සාරාංශ වාර්තා සකස් කළ යුතු වුවත් ඒ අනුව වාර්තා සකස් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂවල ලැබී තිබූ ආදායම නිවැරදි බව තහවුරු කර ගත නොහැකි විය. | ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා කිහිප වරක් දැනුවත් කලද අදාල සාරාංශ වාර්තා එවීම මේ දක්වා සිදු නොවූ අතර ඊළඟ මහා සභා රැස්වීමේදී අදාළ සාරාංශ වාර්තා ගෙන්වා ගැනීමට නැවත වරක් දැනුවත් කිරීමට සටහන් කර ගතිමි. | සාරාංශ වාර්තා පිළියෙල කර ගෙන්වා ගැනිමට කටයුතු කළ යුතු බව. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම තුළ කාර්යයන් 18 ක් ඇතුළත් කර තිබූ හදවත් සැත්කම් සඳහා දහම් පාසැල් ගුරුවරුන්ට ආධාර ලබා දීම හැරුණු විට අනෙකුත් කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රටේ පැවති අයහපත් අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව දන්වා සිටිමි | ක්‍රියාකාරී සැලැස්ම තුල සැලසුම් කල කාර්යයන් නිසි පරිදි ඉටු කළ යුතු බව |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017, 2018 වර්ෂවලට සාපේක්ෂව දහම් පාසැල් කොඩි අලෙවි ආදායම වසරින් වසර අඩුවී ඇති අතර කොඩි මුද්‍රණය සහ අලෙවිය නිසි කළමනාකරණයකින් යුක්තව සිදු නොකිරීම මෙම ආදායම අඩුවීමට හේතු වී ඇති බව නිරීක්ෂණය කෙරේ. | රටේ පැවති අයහපත් සෞඛ්‍යය තත්ත්වය හා ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් 2019 වර්ෂයෙන් පසුව මේ වර්ෂය දක්වාම කොඩි මුද්‍රණය කර අලෙවි කිරීමට නොහැකි වූ බැවින් කොඩි ආදායම අඩු වූ බව දන්වා සිටිමි. | කොඩි අලෙවි ආදායම වැඩි කර ගැනීමට ක්‍රියා කළ යුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 134(2) අනුව අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මේ සම්බන්ධව නව පාලක මණ්ඩලය දැනුවත් කර ඉදිරියේදී ඉහත (අ) (i) හි සඳහන් පරිදි කටයුතු කරමින් අභ්‍යන්තර විගණන සැලැස්මක් ද සකස් කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (i) 38 (ඊ) සහ 40 වගන්ති අනුව විගණනය කරනු ලබන අස්ථිත්වයක ගණන් දීමේ නිලධරයා විසින් අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින්ද විගණනයක් සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධව නව පාලක මණ්ඩලය දැනුවත් කර ඉදිරියේදී ඉහත (අ) (i) හි සඳහන් පරිදි කටයුතු කරමින් අභ්‍යන්තර විගණන සැලැස්මක් ද සකස් කිරීමට සටහන් කර ගතිමි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| | (ii) 41(1) වගන්තිය අනුව, විගණන හා කලමනාකරණ කමිටු පත්කර ඒ අනුව අරමුදලේ ක්‍රියාකාරිත්වයන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වලදීම අරමුදල සම්බන්ධවද සාකච්ඡා කිරීමට ඉදිරියේදී කටයුතු කිරීමට බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් සමඟ සාකච්ඡා කිරීමට කටයුතු කරමි. | පනතේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු බව. |